Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# කෙටි සටහන් සංග්‍රහය

## දහම් පාසල් පෙළ පොත ආශ්‍රිතව

# 03 ශ්‍රේණිය



### සිරිපැරකුම්බා දහම් පාසල - ලුණුගම

ඩබ්.ඒ.එන්.එම්. වික්‍රමආරච්චි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ආදරණීය පුංචි දුවේ පුතේ
# ඔබේ දහම් නැණ වඩවාලන්නට
# පිදෙන දහම් පඬුරකි
# මේ..............

## මතු පරපුරක ආයෝජනය දහම් පාසලයි

### සිරිපැරකුම්බා දහම් පාසල - ලුණුගම

ඩබ්.ඒ.එන්.එම්. වික්‍රමආරච්චි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පෙළගැස්ම

| පාඩම | පිටු අංකය |
|---|---|
| (01) දින දින තුනුරුවන වඳිමු | 01 |
| (02) පින්වත් කුමාරයෙක් උපන්නා | 02 |
| (03) සිදුහත් බෝසතාණෝ පැවදි වෙති | 03 - 04 |
| (04) බුදුවීම | 05 - 06 |
| (05) සදහම් දෙසීම | 07 - 09 |
| (06) පිරිනිවන් පෑම | 10 |
| (07) සිහි කර කර ගුණ මුදු මුනිසඳු නමදිමු සාදු | 11 |
| (08) කළගුණ දත් සිංහයා | 12 |
| (09) දෙමාපියන්ට සලකමු මෙලෙසට | 13 - 14 |
| (10) මට දැන් පුළුවන් | 15 |
| (11) භාවනා ඉරියව් හුරු කර ගනිමු | 16 |
| (12) භාවනා කරමු | 17 |
| (13) විසිතුරු ලෙස දහම් දෙසූ බුදු හාමුදුරුවෝ | 18 |
| (14) ධම්මපද ගාථා | 19 |
| (15) විවේකය ගත කරමු මෙලෙසට | 20 |
| (16) ලක්දිවට පෑයූ පොසොන් සඳ | 21 |
| (17) දෙවනපෑතිස් රජතුමා | 22 |
| (18) කයින් පිරිසිදු වෙමු | 23 |
| (19) ගුරු සිත පිනවා උගනිමු සොඳවා | 24 |
| (20) පෝදා සිල් සමාදන් වෙමු | 25 |
| (21) පොදු දේපළ රැක ගනිමු | 26 |
| (22) බුදු පුද ලද බෝ රද | 27 |
| (23) පොසොන් උදාවයි මිහින්තලාවයි | 28 |
| (24) මව්පියන්ට සැලකූ ගිරවා | 29 |
| (25) දහම් කවි | 30 |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 01 - දින දින තුනුරුවන වඳිමු

ත්‍රිවිධ රත්නය (තෙරුවන , තුනුරුවන)

**බුද්ධ**

ලොව අන් කිසිවෙකුට සමාන කළ නොහැකි උදාර ගුණ ඇති බුදුන් වහන්සේ බුද්ධ නම් වෙයි.

**ගුණ 9 කි.**

**ධම්ම**

බුදුරජාණන් වහන්සේ කළ දේශනාව ධර්ම රත්නයයි.

**ගුණ 6 කි.**

**සංඝ**

බුදුරජාණන් වහන්සේගේ ශිෂ්‍යන් වහන්සේලා සංඝ රත්නයයි. **ගුණ 9 කි.**

- සංඝයා වහන්සේලා බුද්ධ පුත්‍ර ලෙස ද හඳුන්වයි.
- සංඝයා වහන්සේ සතු උසස් ගුණාංග
  - සංවරකම
  - ප්‍රිය වචන කතා කිරීම
  - වැරදි දේ නොකිරීම
  - අන් අය සමඟ එකට එක්ව කටයුතු කිරීම
  - අනුනට පිහිට වීම
  - මිත්‍රශීලී බව
  - අනෙක් අයට යහමග කියා






## තෙරුවන් සරණ යන කෙනෙකු තුළ

- ආත්ම විශ්වාසයක් ඇති වේ.
- සිතේ කැලඹිලි ගතියක් ඇති නොවේ.
- සුවසේ නින්ද යයි.
- ප්‍රබෝධමත්ව අවදි වෙයි.
- සිත පිරිසිදු නිසා මතක ශක්තිය ද වැඩිය.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 02 පාඩම - පින්වත් කුමාරයෙක් උපන්නා

## "සුඛෝ බුද්ධානං උප්පාදො"

## බුදු උපත සැපතකි.

- දඹදිව **කපිලවස්තු නුවර (කිඹුල්වත් නුවර) සුද්ධෝදන රජතුමා** රජකම් කළා.

- **මහමායා දේවිය** එතුමාගේ අගමෙහෙසියයි.

**සුදු ඇත් පැටවකු රිදී කන්දකින් බැසගෙන විත් සුදු නෙළුම් මලක් ගෙන තුන්වරක් කුංචනාද කර දේවියගේ කුසට ඇතුළු වුණා.** මෙය මහාමායාදේවිය බෝසතුන් මව් කුස පිළිසිඳගැනීමට පෙර දුටු සිහිනයයි. එදා **ඇසළ පුර පසළොස්වක පොහාය** දිනයයි.



- සිහින ඵලාපල විමසන විට දී **පින්බර කුමරකු උපදින බව** පඬිවරු රජතුමාට පැවසුවා.

- කුමරු ලැබීමට දින ආසන්න වන විට මහාමයා දේවිය පෙරහරකින් එතුමියගේ දෙමව්පියන් වෙසෙන **දෙව්දහ නුවර** බලා ගියා.

- අතරමඟ යන ගමනේ දී **ලුම්බිණි සල් උයනේ** දේවිය නැවතුණා. එහි දී සිදුහත් බෝසත් කුමරු උපත ලැබුවා. එදා **වෙසක් පුර පසළොස්වක පොහොය** දිනය යි.



- දෙව්දහ නුවර යන ගමන නවතා අලුත උපන් කුමරු ද සමඟ මහාමායා දේවිය යළිත් කපිලවස්තු පුරයට ළඟා වුණා.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 03 පාඩම- සිදුහත් බෝසතාණෝ පැවිදි වෙති.

## සිදුහත් බෝසත් කුමරුගේ ශිල්ප ඉගෙනුම හා තරුණ විය

- සිදුහත් කුමරු **සර්වමිත්‍ර බමුණු** පඬිතුමාගෙන් ශිල්ප ඉගෙනගත්තා.
- **අවුරුදු 16 වන විට** සුද්ධෝදන රජතුමා සුද්ධෝදන කුමරුට රාජ්‍ය භාර දීමට කටයුතු කළා.
- දෙව්දහ නුවර **සුප්‍රබුද්ධ රජතුමාගේ දියණිය වූ යශෝධරා කුමරිය** සමඟ සිදුහත් කුමරු විවාහ වුණා.



## සතර පෙර නිමිති දැකීම සහ රාහුල කුමරු ඉපදීම

- දිනක් තම අශ්ව රථයෙන් චන්න ඇමති ද සමඟ උයන් කෙළි සඳහා පිටත්ව යන මොහොතේ දී **මහල්ලෙකු** දුටුවා. මේ ආකාරයට දින සතරක දී **ලෙඩෙක්** , **මලමිනියක්** , **පැවිදිරුවක්** යන අවස්ථා සිදුහත් කුමරු දුටුවා.
- ජීවිතයේ ඇති නිසරු බව කුමරුට එයින් වැටහී ගියා.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- අවසන් දින දුටු පැවදි රුව නිසා කුමරුගේ පෙනුම ශාන්ත වුණා. මේ පිළිබඳව කල්පනා කරමින් උයනේ සිටින විට රජමාළිගයේ සිට පැමිණි පණිවුඩකරුවකු **යශෝධරා කුමරියට පුත් කුමරෙකු ලැබුණු බව** කියා සිටියා.

- මෙය ඇසූ කුමරුට "**රාහුලයකු උපන්නා , ගිහි ගෙදර ඇති බැඳීම වැඩි වුණා .**" යැයි කියවුණා. ඒ අනුව කුමරුට **රාහුල** ලෙස නම් තැබුවා.

- පණිවුඩය ලැබීමෙන් පසු එතුමා නැවත රජමාළිගයට පිටත් වුණා.

- එදා කුමරුගේ මුහුණේ තිබුණු ශාන්ත පෙනුම දුටු **කිසාගෝතමී කුමරිය** ගීයක් ගැයුවා.

නිබ්බුතා නූන සා මාතා
නිබ්බුතා නූන සෝ පිතා
නිබ්බුතා නූන සා නාරි
යස්සායං ඊදිසෝ පති

වෙමන් පුතකු ලද මවක්
මෙවන් පුතකු ලද පියෙක්
මෙවන් හිමියකු ලද කතක්
නිසැකවම නිවුණෝ වෙත්

## අභිනිෂ්ක්‍රමණය

- එදින **ඇසළ පුන් පොහෝ දිනයක්** වුණා. සිදුහත් කුමරු අලුත උපන් කුමරු දෙස ඈත සිට බලා සැනසී චන්න හා කන්ථක අසු සමඟ මැදියම් රැයෙහි මාළිගයෙන් පිටවුණා.





- එසේ මාළිගාවෙන් පිට වූ කුමරු **අනෝමා ගංගාවෙන්** එතෙර වුණා.

- ගං ඉවුරේ සුදු වැලි තලාවේ දී "**ඡන්න මා ආවේ මහණ වෙන්නයි. මේ අශ්වයාත් ආභරණත් ගෙන ගොස් පිය රජතුමාට භාර දී මා මහණ වූ බව පවසන්න**". යැයි සිදුහත් කුමරු පැවසුවා.

- සිදුහත් කුමරු තම කඩුවෙන් කෙස් වැටිය කපා දමා මහණ වුණා.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 04 පාඩම - බුදු වීම

- **අනෝමා ගං තෙර** දී පැවදි වූ බෝසතාණන් වහන්සේ අසළ වූ **අනුපිය නම් අඹ වනයට** වැඩියා.

- ඉන් පසු එයින් නික්ම **රජගහනුවර** බලා පිටත් වුණා.

- රජගහනුවර පිඩු සිගා වැඩ ප්‍රමාණවත් ආහාර ලැබුණු පසු **පාණ්ඩව පර්වතය** ළඟට ගොස් ආහාර වැළඳුවා. බෝසතාණන් එතැන සිටින බව දැනගත් **බිම්බිසාර රජු** පැමිණ තමා සමග එක්ව රට පාලනය කරන්න යැයි ඇරයුම් කළා.

- තමන්ට රජ සැපතින් ඵලක් නොවන බවත් තමන් නිවන් සොයා යන බවත් සිදුහත් බෝසතාණන් රජතුමාට දන්වා සිටියා.


- රජගහනුවරින් නික්මුණු බෝසතාණෝ **විශාලා මහනුවරට** පැමිණියා.

- **භග්ගව , ආලාරකාලාම , උද්දකරාම පුත්ත** යන ගුරුවරුන් යටතේ තවුස් දම් පිරුවා.

- එතැනින් නොනැවතුණු බෝසතාණන් වහන්සේ ඔවුන් දන්නා සියලු දේ ඉගෙන ගත් පසු එහි නොසිට **උරුවෙල් දනව්වට** ගොස් භාවනාවේ යෙදුණා.

- **දුෂ්කර ක්‍රියාවේ යෙදුණා**. එසමයෙහි **කොණ්ඩඤ්ඤ , වප්ප , භද්දිය , මහානාම , අස්සජි** යන පස්වග තවුසන් බෝසතාණන් බුදුවෙතැයි බලාපොරොත්තුවෙන් උවටැන් කළා.

- දුෂ්කර ක්‍රියා අත්හැර **මැදුම් පිළිවෙත** අනුගමනය කළ බෝසතාණන්ව පසුව පස්වග තවුසන් හැර ගියා.





- සිදුහත් බෝසත් තුමා පැවදි වී **අවුරුදු හයක්** ගතවූ දින නේරංජනා ගඟ අසළ වූ **අජපාල නුග රුක** මුල වාඩි වී භාවනාවේ යෙදුණා.

- **සුජාතා සිටු දේවිය** කිරිපිඩු පූජා කළා. එම කිරිපිඩු දාය වළඳා උන්වහන්සේ එම රන්තලිය අනෝමා ගඟේ පා කර හැරියා.





Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


- ඉන්පසු බෝසතාණන් බෝධි මූලය වෙත වැඩම කළා.

- **සොත්ථිය බමුණාගෙන්** ලැබුණු කුස තණ අට මිට අතුරා **බුදු බව ලබා මිස නොනැගිටිමි** යන අදිටනින් බෝධි වෘක්ෂ මූලයේ රාත්‍රිය මුළුල්ලේ භාවනාවේ යෙදුණා.



- එදින **වෙසක් පුන් පොහෝ දින** අළුයම් කාලයයි.

- බෝසතාණන් වහන්සේ සියළු කෙළෙස් නසා ලොව්තුරා බුදු බවට පත් වුණා.




Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 05 පාඩම - සදහම් දෙසීම

- බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය පසු **සති හතක්ම** බෝ මැඩ අසළ ගත කළා.




බෝ මැඩ අසළ තමන් වහන්සේ **අවබෝධ කර ගත් ධර්මය මෙනෙහි කරමින්** ගත කළා.




බෝධීන් වහන්සේට මුණලා **බෝධිය දෙස ඇසිපිය නොහෙළා** බලා සිට බෝධීන් වහන්සේට ගෞරව කළා.




බෝ මැඩ අසළම **සක්මන් කරමින්** ගත කළා




**රුවන්ගෙයි** වැඩ සිටිමින් **ධර්මය මෙනෙහි කළා.**


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com




**අජපල් නුග රුක මුල** වැඩ සිටියා. බුදුරදුන්ගේ සිත බිඳවීමට මාර දූවරු පැමිණ රංගනයේ යෙදුණා.




බුදුරජාණන් වහන්සේට වැසි සුළං ආදියෙන් වන පීඩා වැලකූ **මුචලින්ද** නාගයා




රාජායතන නම් වූ **කිරිපළු නුග රුක** මුල වැඩ සිටියා. **තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන්** විලඳ හා මී පැණි පූජා කළා.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- මුලින් ධර්මය දේශනා කිරීමට සුදුස්සන් ලෙස තම ගුරුවරුන් තෝරා ගත්ත ද ඒ අය මේ වන විට ජීවතුන් අතර නොසිටි බව දුටුවා.
- මේ අනුව බුදුරජාණන් වහන්සේ පස්වග තවුසන් සොයා **බරණැස ඉසිපතනය** බලා වැඩම කළා.
- අතරමගදී **උපක නම් ආජීවකයකු** බුදුරදුන්ට මුණගැසුණා.
- බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතනයේ දී පස්වග තවුසන්ට **දම්සක් පැවතුම් සූත්‍රය** දේශනා කළා.
- එදින **ඇසළ පුර පසළොස්වක** පෙහෝ දිනයයි.
- එම දේශනාව අසා **පළමුව කොණ්ඩඤ්ඤ** තවුසා සෝවාන් වුණා.
- තවුසන් පස් දෙනාම තව දුරටත් බන අසා රහත් වුණා.



එතැන් සිට බුදුරජාණන් වහන්සේ **අවුරුදු 45** මුළුල්ලේ ලෝක සත්වයා කෙරෙහි පතළ කරුණාවෙන් ලෝක සකත්වයා හට ධර්මය දේශනා කළා.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 06 - පිරිනිවන්පෑම

- බුදුරජාණන් වහන්සේ **අවුරුදු 45 ක්** මුළුල්ලේම ධර්මය දේශනා කළා.
- බුදුරදුන් **අවසනා වස් කාලය** ගත කළේ **බේලුව ගමේ** ය.
- ඒ වන විට බුදු රදුන්ගේ වයස **අවුරුදු 80** කි.
- **චුන්ද කර්මාර පුත්‍රයා** විසින් පිළිගන්වනු ලැබූ දානය බුදුරදුන් වැළඳු **අවසන් දානයයි**.
- **මල්ල රජ දරුවන්ගේ උපවත්තන සල් උයනේ දී ආනන්ද හිමියන්** ලවා **සල් ගස් දෙකක් මැද ආසනයක්** පනවා **උතුරට හිසලා** සැතපුණා.
- බුදුරදුන් පිරිනිවන්පාන බව දැනගත් ආනන්ද හිමියන් ශෝක වුණා.



**“මහණෙනි සියලු දේම නැසෙන සුළුය. පමා නොවී දුකින් මිදීම සඳහා උත්සාහ කරන්නග කුසල් දහම් කරන්න.”**

**බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට කළ අවසන් අවවාදයයි.**

- මල්ල රජ දරුවන්ගේ උපවත්තන සල් උයනේ දී ශාන්ති නායකයාණන් වහන්සේ පිරිනිවන් පෑවා.
- එදා **වෙසක් පොහෝ** දිනයයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 07 - සිහි කර කර ගුණ මුදු මුනිසඳු නමදිමු සාදු

බුද්ධ, ධම්ම, සංඝ තෙරුවන් වේ.

බුදු ගුණ 9 කි.

| ගුණය | තේරුම |
|---|---|
| 1 - අරහං | කෙළෙස් දුරු කළ , රහසින්වත් පව් නොකරන සියළු දෙනාගේ පූජාවන්ට සුදුසු වන නිසා |
| 2 - සම්මා සම්බුද්ධ | නිවැරදිව තමන් වහන්සේ විසින්ම ධර්ය අවබෝධ කරගත් නිසා |
| 3 - විජ්ජාචරණ සම්පන්න | විද්‍යාවන්ගෙන් හා චරණයන්ගෙන් යුක්ත වන නිසා |
| 4 - සුගත | අන්ත වල නොගැටී නිවන් අවබෝධ කර ගෙන සත්‍යාවබෝධයට මග දැක්වූ නිසා |
| 5 - ලොකවිදූ | සකල ලෝකයම ස්වාකාරයෙන් දන්නා නිසා |
| 6 - අන්ත්තර පුරිස දම්ම සාරථී | දමනය කළ යුතු අය දමනය කරන්නවුන් අතරින් අග්‍ර වන නිසා |
| 7 - සත්ථා දේවමනුස්සානං | දෙවි මිනිසුන්ට ශාස්තෘ වන නිසා |
| 8 - බුද්ධ | දත යුතු සියල්ලම අවබෝධ කර ගත් නිසා |
| 9 - භගවා | භාග්‍යවත් බැවින් |

ඉතිපිසෝ භගවා

අරහං

සම්මා සම්බුද්ධෝ

විජ්ජාචරණ සම්පන්නෝ

සුගතෝ

ලෝකවිදූ

අනුත්තරෝ පුරිසදම්ම සාරථී

සත්ථා දේවමනුස්සානං

බද්ධෝ

භගවා



කයිනුත් බුදු හිමි සරණ යමි
බසිනුත් බුදු හිමි සරණ යමි
ගතිනුත් බුදු හිමි සරණ යමි
සම්බුදු හිමියන් සරණ යමි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 08 - කළ ගුණ දත් සිංහයා

(පෙළපොතේ දැක්වෙන කතාව ඉතාමත් කෙටියෙන් පහත පරිදි වේ.)

පන්සිය පනස් ජාතක කතා පොතේ එන **ගුණ ජාතය** මෙම කතන්දරයයි.

දිනක් කැලෑවේ මඩේ එරුණු සිංහයෙකුට ගොඩට ඒමට සිවලෙකු උපකාර කළා.

එම උපකාරය මතක තබා ගත් සිංහයා සිවලාට තම යහළුවෙකුට මෙන් ඉතා හොඳින් සැලකුවා.

සිවල් පවුලට ජීවත් වීමට තම ගුහාවේ ද කොටසක් ලබා දුන්නා.

සිංහදේනුව මීට අකමැති වීම නිසා ඔවුන් අතර ගැටළු ඇති වුණා.


සිවල් පවුල සිංහ ගුහාවෙන් පිටත් වීමට සූදානම් වුණා.

තම ජීවිතය බේරුවේ මේ සිවලා යැයි සිංහයා සිංහ දේනුවට පැහැදිලි කළ පසු ගැටළු ඇති වුණේ නෑ

## අතීත කතාව

**ආනන්ද හාමුදුරුවන්ට ලැබුණු රෙදි පිළි 500 ක් එකම භික්ෂුවකට දුන් බව තවත් භික්ෂුවක් විසින් දුටුවා. ඒවා එක් එක්කෙනාට බෙදා නොදී එකම අයෙකුට දීමේ ආනන්ද හාමුරුවන්ගේ ක්‍රියාව එක් හාමුදුරු නමක් බුදුන් වහන්සේට කීවා.**

**ඒ හාමුදුරුවන් ආනන්ද හාමුදුරුන්ට බොහෝ අපකාර කළ නිසා ඊට කළගුණ සැලකීමට එසේ කළ බව බුදුන් වහන්සේ දේශනා කළා. ආනන්ද පෙර භවයෙත් මේ ලෙයසි කියා මෙම ජාතක කතාව දේශනා කළා.**



කතාවෙන් අපට ලැබෙන ආදර්ශ

- කළගුණ සැලකීම.
- කරදරයට පත්වූ අයට උපකාර කිරීම.
- සමගිව ජීවත් වීම.
- ගැටලු ඇති වූ විට කලබල නොවී කරුණු පැහැදිලි කර දීම
- කුල භේද නොසලකා හොඳ යහළුවන්ට හොඳින් සැලකීම.
- හදිසි තීරණ වලට එළඹෙන්නේ නැතිව සිදු වූ දෙය සොයා බැලීම.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 09 - දෙමව්පියන්ට සළකමු මෙලෙසට

දසමාසේ උරේකත්වා
පොසේසී වුද්ධි කාරණං
ආයු දීඝං වස්ස සතං
මාතු පාදං නමාමහං

දසමාසයක් මා කුස තුළ දරාගෙන
ලේ කිරි කර පොවා හැදු වැඩු දයාවෙන
සිය වසකටත් වැඩි ආයුෂ ලබා ගෙන
වැජඹේ මව්නි පතනෙමි පා වැඳ බැතින



අදරැති පුතුනි යයි මා සිප වැලඳ ගෙන
අපමණ ගැහැට විඳ ඇති දැඩි කළ පෙමින
රජුන් මැදට වුව යෑමට හැකි ලෙසින
දිරි දුන් පියාණෙනි පා නමදිමි බැතින

වුද්දිකාරෝ ආලිංගිත්වා
චුම්බිත්වා පිය පුත්තකං
රාජ මජ්ඣං සුපතිට්ඨං
පිතු පාදං නමාමහං



අපි අම්මට තාත්තට සලකන්නේ කොහොම ද ?

- අම්මා හෝ තාත්තා ළඟට පැමිණෙනවනම් අසුනෙන් නැගිට ගෞරව කිරීම
- අම්මගේ තාත්තාගේ හිත රිදෙන වැඩ නොකිරීම
- අම්මා තාත්තා කියන දේට ඇහුම් කන් දී කීකරුව සිටීම
- ගෙදර සහ ගෙවත්තේ වැඩ වලට උදව් කිරීම
- අම්මා තාත්තා සතුටු වන ලෙස හොඳින් ඉගෙනීම
- තමන් අම්මාට තාත්තාට හොඳ ආරංචි ලැබෙන සේ හැසිරීම



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

අපි කොහොමද දෙමව්පියන්ට උදව් කරන්නේ



වත්තේ වැඩ වලට තාත්තට
උදව් කරන්න පුළුවන්



රෙදි සෝදන විට අම්මට
උදව් කරන්න පුළුවන්



භාජන සෝදන විට අම්මට
උදව් කරන්න පුළුවන්



අම්මා උයන විට උදව්
කරන්න පුළුවන්



අම්මට බඩු ගෙනියන්න
උදව් කරන්න පුළුවන්



අම්මට ගේ අතුගාන්න
උදව් කරන්න

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 10 - මට දැන් පුළුවන්



උදෑසනින් අවදි වෙන්න



ඇඳ පිළිවෙලකට හදන්න



මුව සෝදා පිරිසිදු ඇඳුම් ඇඳ ගන්න



තනියම කෑම කන්න



වට්ටියකට මල් නෙලන්න



නිවස පිරිසිදු කරන්න




මල් වලට වතුර දාන්න

**ඔබේ කටයුතු ඔබ විසින් ඉටු කිරීම බොදු දරුවෙකු සතු යහපත් ලක්ෂණයක්.**

**අන් අය ගැන බලාපොරොත්තු තබා ගැනීමෙන් නිසි කලට කාර්යයන් ඉටු නොවීම නිසා ඔබට පාඩු සිදුවිය හැක.**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 11 - භාවනා ඉරියව් හුරු කර ගනිමු



ඉඳගෙන භාවනා කිරීම

හිටගෙන භාවනා කිරීම

ඇවිදිමින් භාවනා කිරීම



බද්ධ පර්යංකය



අර්ධ පර්යංකය



හිටගෙන භාවනා කිරීම



සක්මන් භාවනාව

දිවා රෑ දෙකෙහිම භාවනාවට යොමු වූ උතුම් බුදු සව්වෝ සැමදා හොඳින් පිබිදෙත්

- හිස හා කොන්ද කෙළින් තබා ගන්නවා
- ඇස් අඩවන් කර ගන්වා
- දකුණු අතේ පිටි අත්ල මත වම් අත්ල තබාගන්නවා

- හුගත් දුර බලාගෙන සක්මන් කරන්නේ නෑ
- ඇස් අඩවන් කර ගන්නවා
- දකුණු අතේ පිටි අත්ල මත වම් අත්ල තබාගන්නවා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 12 - භාවනා කරමු

**විවිධ සිතුවිලි නිසා අපිරිසිදු වන අපේ සිත සංවර කර ගැනීම සඳහා භාවනාව යොදා ගනී.**



## 01 පියවර

සුදුසු ඉරියව්වෙන් වාඩි වෙන්න.

එකිනෙකා නොගැටෙන ලෙස වැඩි ඉන්න.

දෑත් නළලේ තබා නමස්කාරය සහිත පන්සිල් සමාදන් වෙන්න

## 02 පියවර

වම් අත උඩ දකුණු අත්ල තබා ගන්න.

නාසය අගට සිත යොදන්න.

හුස්ම නාසයෙන් ඇතුළු වන විට එකයි

හුස්ම නාසයෙන් පිට වන විට දෙකයි

නැවතත් හුස්ම ඇතුල් වන විට තුනයි

නැවතත් හුස්ම පිටවන විට හතරයි
(මෙලෙස හය තෙක් ගණන් කරන්න.)

විනාඩියක් පමණ ගිය පසු සාධු කාර දී දෙවියන්ට පින් අනුමෝදන් කර ප්‍රාර්ථනා ගාථාව කියා අවසන් කරන්න.

**ආකාසට්ඨා ච භුම්මට්ඨා**
**දේවා නාගා මහිද්ධිකා**
**පුඤ්ඤං තං අනුමෝදිත්වා**
**චිරං රක්ඛන්තු දේසනං**

**දෙවියන්ට පින් දීම**

අහසෙහි පොළවෙහි වාසය කරන මහා තේජසක් ඇති දෙවියන් මේ පින අනුමෝදන් වී ශාසසනය බොහෝ කල් ආරක්ෂා කෙරේවා.

**ප්‍රාර්ථනා ගාථාව**

**ඉමිනා පුඤ්ඤකම්මේන**
**මා මේ බාලසමාගමෝ**
**සතං සමාගමෝ හෝතු**
**යාව නිබ්බානපත්තියා**

මේ පුන්‍ය කර්මයෙන් නිවන් දකින තුරු මා හට අසත්පුරුෂ බාලයන් ඇසුරට නොලැබේවා. සත්පුරුෂ මිතුරන්ම ඇසුරට ලැබේවා.

**ආනාපානසති භාවනාවෙන් ...........**

- මතක තබා ගැනීමේ ශක්තිය දියුණු වෙයි.
- ශාරීරික සෞඛ්‍යයට හිතකරයි.
- නිරවුල්ව සිතන්නට හා වැඩ කරන්නට හැකියාව ලැබෙයි.
- සන්සුන්ව ක්‍රියා කිරීමට පුරුදු වෙයි.

**හුස්ම ඉහළට ගනීමත් හුස්ම පහළ හෙළීමත් සිහියෙන් යුතුව කිරීම ආනාපානසතියයි.**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 13 - විසිතුරු ලෙස දහම් දෙසූ පොඩි හාමුදුරුවෝ

- **රජගහනුවර** එක්තරා සිටු පවුලක රූමත් දියණියක් සිටියා.
- ඇය ආගම දහමට ඉතාම ලැදියි. මහණ දම් පිරීමට පවා ඉතා කැමැත්තෙන් සිටියා.
- නමුත් ඇගේ දෙම්පියන් ඊට අකමැති වූ නිසා ඇය විවාහයෙන් පසු සැමියාගෙන් අවසර ගෙන මහණ වුණා.
- ඇය මහණ වුණේ **දේවදත්ත තෙරුණ්ගේ ආරාමයකයි**.
- මහණ වීමට පෙර ඇය ගැබිණියක්ව සිටියත් ඇය එය දැන සිටියේ නෑ.
- මෙය ආරාමයේ අනෙක් අය දැනගත් පසු ඇයව ආරමයෙන් ඉවත් කිරීමට කටයුතු යෙදුණා.
- නමුත් ඇය බුදුරදුන් හමුවට ගොස් ඇය නිර්දෝශී බව කියා සිටියා.
- විශාඛාව ඇතුළු පිරිසක් ඇයව පරීක්ෂා කොට ගැබ් ගැනීම ගිහි කළ දී සිදු වූ බව දැනගත්තා.
- දරුවා ලැබීමෙන් පසු ඇය ඉතා ආදාරයෙන් දරුවා පෝෂණය කළා.
- **කොසොල් රජතුමා** මෙම දරුවා මාළිගයට ගෙන ගොස් හදා වඩා ගත්තා.
- කුමාරයාට **කාශ්‍යප** ලෙස නම යෙදුණා.
- මාළිගයේ හැදී වැඩුණු නිසා ඔහු **කුමාර කාශ්‍යප** නම් වුණා.
- මව මහණ වී ඇති බව පසුව දැනගත් කාශ්‍යප කුමරුට ද මහණ වීමට අවශ්‍ය වුණා.
- රජතුමා කුමාර කාශ්‍යප කුමාරයා බුදුරදුන් ළඟ පැවදි කරවූවා

**විසිතුරු ලෙස දහම් දෙසන භික්ෂූන් වහන්සේලා** අතර අගතනතුරට පත්වූවා.

### කුමාර කාශ්‍යප පොඩි හාමුදුරුවන් තුළ පැවැති හොඳ ලක්ෂණ

- දක්ෂයි
- කීකරුයි

### කුමාර කාශ්‍යප පොඩි හාමුදුරුවන් තුළ පැවැති දක්ෂතා

උපමා භාවිතා කරමින් විසිතුරු ලෙස දහම් දෙසීමට හැකියි.



### කුමාර කාශ්‍යප පොඩි හාමුදුරුවන් තුළ පැවැති දක්ෂතා පෙන්වූ අවස්ථාවක්

පායාස රජතුමාට **පායාසි රාජඤ්ඤ සූත්‍රය** දේශනා කිරීමත් එම ධර්ම දේශනාව අසා එතුමා පැහැදීමට ලක්වීම

### කුමාර කාශ්‍යප පොඩි හාමුදුරුවන් ගේ චරිතයෙන් ලද හැකි ආදර්ශය

**කුඩා කාලේ සිටම වැඩිහිටියන්ට කීකරුව දකක්ෂතා දියුණු කර ගැනීමෙන් උසස් අයගෙන් පවා සැලකිලි ලැබෙන බව**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



# 14 - ධම්මපද ගාථා

ධම්මපදය යනු බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ගාථා ඇතුළත් කරමින් ලියන ලද ධර්ම ග්‍රන්ථයකි.




***විශාඛා උපාසිකාව නිමිති කරගෙන වදාළ ගාථාවකි.***

විශාඛා උපාසිකාව බුදුරජාණන් වහන්සේ දැකීමට **සැවැත්නුවර ජේතවනාරාමයට** ගියා.

එහිදී ඇය පැළඳ සිටි මහලිය පළඳනාව ගලවා පසෙක තබා ධර්ම ශාලාවට ගියත් ආපසු එන ගමනේ දී එය අමතක වුණා.

ආනන්ද හිමියන් විසින් එය දැක පරිස්සමට අරන් තැබුවා.

"පළඳනාව එතැනැම තිබුණොත් අරන් එන්න. නැතිනම් අවශ්‍ය නෑ "කියා ඇය තම සේවිකාවක් ජේතවනාරාමයට පිටත් කළා.

පසුව පළඳනාව එතැන නොතිබූ නිසා සේවිකාව නැවත පැමැණියා. (ආනන්ද හිමියන් පළඳනාව ලබා දුන්නත් ඇය එය පිළිගත්තේ නෑ)

පසුව පළඳනාව විකුණා පූර්වාරාමය නම් ආරාමයක් කරවා පූජා කළා.

**බුදු දහම තුළ කුසලය හොඳ ලෙස හඳුන්වා ඇත.**

**ජීවිතයේ තමන්ට ලැබෙන දෙය දෙවියන්ට හෝ බ්‍රහ්මයෙකුට දිය නොහැක.**

**තමන් කරන දෙය අනුව තමන්ට මෙලොව ජීවිතයේ සැප හෝ දුක හිමි වේ.**

යථාපි පුප්ඵ රාසිම්හා
කයිරා මාලා ගුණේ බහු
ඒවං ජාතේන මච්චේන
කත්තබ්බං කුසලං බහුං

**මල් මාලා සාදන මල් කරුවකු හොඳ හොඳ මල් , ලස්සන ලස්සන මල් තෝරා ගෙන මල් මාලා සාදන ලෙසින් මෙලොව උපත ලද අය හොඳ හොඳ පින්කම් කළ යුතුය.**

***ඡන්න තෙරුන් අරබයා***

බුදුන් වහන්සේට කිට්ටුවෙන් සිටිය යුතු තමා මිස අගසව් දෙනම වන සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලා නොවන බව පවසමින් යන යන තැන අගසව්දෙනමට පරිභව කරන්නට ඡන්න තෙරුන් පුරුදුව සිටියා.

මෙය බුදුරදුන්ට ආරංචි වී **අගසව් දෙනම ඔබේ කල්‍යාන මිතුරෝය** යැයි පවසමින් ඡන්න තෙරුන්ට මේ ගාථාව දේශනා කළා.

න භජේ පාපකේ මිත්තේ
න භජේ පුරිසාධමේ
භජේථ මිත්තේ කල්‍යාණේ
භජේථ පුරිසුත්තමේ

**පව් කරන මිතුරන් ඇසුරු නොකරන්න. ගුණ නුවණින් අඩු පුද්ගලයින් ඇසුරු නොකරන්න. හොඳ සිතුවිලි ඇති , හොඳ වචන කතා කරන , හොඳ වැඩ කරන මිත්‍රයන් ම උතුම් පුද්ගලයන්ම ඇසුරු කරන්න.**

| කල්‍යාන මිතුරා | පව්ටු මිතුරා |
|---|---|
| උපකාර වුවමනා විට උපකාර කරයි | තමාගේ ප්‍රයෝජනය පිණිස මිතුරන් ඇසුරු කරයි |
| විපතේ දී මිතුරා හැර නොයයි | ක්‍රියාවෙන් නොව කතාවෙන් පමණක් උදව් කරයි |
| දෙලොවම යහපත් කර ගැනීමට මඟපෙන්වයි | හොඳ නරක යන මිතුරා කරන සෑම වැඩකටම උදව් කරයි |
| මිතුරාගේ දියුණුව ගැන සතුටු වෙයි | මිතුරාගේ ධනය විනාශ කරයි සුරාවට හුරු කරවයි |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 15 - විවේකය ගත කරමු මෙලෙසට

ඵලදායී විවේවකයක් ගත කිරීමට නම් ,

| විවේකය ගත කරන ආකාරය | | ප්‍රයෝජන |
|---|---|---|
| 1) ගාථා මිහිරියට ගායනා කිරීම | → | මතකය වැඩි කර ගත හැකි වීම<br>නොදන්නා දේ යළි මතකයට නඟා ගැනීම |
| 2) සංගීත භාණ්ඩ වාදනයට හුරු වීම | → | මානසික වශයෙන් සහනයක් දැනීම<br>නිර්මාණාත්මක හැකියා දියුණු කර ගැනීම |
| 3) මල් වගා කිරීම හා ඒවාට සාත්තු කිරීම | → | සිතට සතුටක් දැනීම<br>කාලය අපතේ නොයෑම |
| 4) යෝග්‍ය විනෝදාත්මක ක්‍රීඩාවල යෙදීම | → | එකට එක්ව කටයුතු කිරීමට හුරු වීම<br>සතුටක් හා විනෝදයක් ලැබීම |
| 5) මානසික නිදහස උදෙසා භාවනා කිරීම | → | සිත සන්සුන් වීම<br>මතක ශක්තිය වර්ධනය වීම |








Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## මිහිඳු මහරහතන් වහන්සේ

| | |
|---|---|
| මව | - වේදිස නගරයේ දේවි නම් බිසව |
| පියා | - ධර්මාශෝක |
| සොහොයුරිය | - සංඝමිත්තා තෙරණිය |
| පැවිදි වීම හා උපසම්පදාව | - විසි වැනි වියේ දී |

**මිහිඳු මහරහතන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරන ලද්දේ පොසොන් පොහෝ දිනක දේවානම්පියතිස්ස රජදවසේයි.**




- **සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දකුණු ශාඛාව මෙරටට වැඩම කරවන ලද්දේ ද මිහිඳු හිමියන්ගේ උපදෙස් අනුවයි.**

මිහිඳු මහරහතන් වහන්සේගෙන් ඉටු වූ සේවාවන් ............

- මිහිඳු හිමියන්ගේ පැමිණීමත් සමඟ ලාංකීය ජනතාවට බෞද්ධ දර්ශනය උරුම වුණා.
- ලංකාව තුළ භික්ෂු ශාසනය පිහිටුවා ගැනීම
- මිහිඳු හිමියන්ගේ උපදෙස් පරිදි සංඝමිත්තා තෙරණිය වැඩම කරවීමෙන් භික්ෂුණී ශාසනය පිහිටුවීම
- කලා නිර්මාණ හා සංස්කෘතික දර්ශනය නිර්මාණය වීම (බුදුරජාණන් වහන්සේගේ දකුණු අකුධාතුව තැන්පත් කරමින් ලංකාවේ ප්‍රථම දාගැබ වන ථූපාරාමය ඉදි කිරීම)
- ධර්ම කරුණු සිංහල භාෂාවට පරිවර්තනය වුණා.

දෙවන පෑතිස් රජතුමාගේ පසුව රජ වූ උත්තිය රජ දවසේ මිහිඳු මහ රහතන් වහන්සේ පිරිනිවන් පෑවා.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 17 - දෙවනපෑතිස් රජතුමා

- ථූපාරාමය ගොඩනැගීම
- මිහින්තලේ අටසැට ලෙන් කරවීම
- දඹදිව සිට ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව වැඩම කරවීමට ක්‍රියා කිරීම
- අනුලා දේවිය ඇතුළු මෙහෙණි වරුන්ට ආරාම ඉදිකරවා දීම
- මහමෙව්නා උයනත් මහා විහාරයත් සඟ සතු කොට පූජා කිරීම
- කාල ප්‍රසාද පිරිවෙන කරවීම
- සුනාහත පිරිවෙන කරවීම
- ඉසුරුමුණි විහාරය , වෙස්සගිරිය , මිහිඳු ගුහාව ඉදි කිරීම
- තිසා වැව ඉදි කිරීම

සේවාවන්




පියා මුටසීව රජතුමායි.

දෙවියන්ට ප්‍රිය යන අරුතින් ධර්මාශෝක රජතුමා තිස්ස රජතුමාටත් දේවානම් පිය යන නම ලබා දුන්නා.

එතැන් පටන් දේවානම් පියතිස්ස නම් වුණා.

**දේවානම්පිය තිස්ස නම ලැබුණු හැටි**

අඹ ප්‍රශ්නය

ඥාති ප්‍රශ්නය

බුද්ධිමත් බව දැක්වුණු අවස්ථා

| | |
|---|---|
| මිහිදු හිමි | - මහරජ මේ ගස කුමක් ද ? |
| රජතුමා | - ඒ අඹ ගසක් ස්වාමීනී |
| මිහිදු හිමි | - මේ අඹ ගස හැර තවත් අඹ ගස් තිබේ ද ? |
| රජතුමා | - බොහෝ අඹ ගස් ඇත. |
| මිහිදු හිමි | - ඒ අඹ ගසත් මේ අඹ ගසත් හැර තවත් ගස් තිබේ ද ? |
| රජතුමා | - බොහෝ ගස් ඇත ස්වාමීනී ඒත් ඒ අඹ ගස් නොවේ |

| | |
|---|---|
| මිහිදු හිමි | - මහරජ තොපගේ නෑයෝ සිටිත් ද ? |
| රජතුමා | - බොහෝ දෙනෙක් සිටිති. |
| මිහිදු හිමි | - නො නෑයොත් සිටිත් ද ? |
| රජතුමා | - බොහෝ නො නෑයෝත් සිටිති. |
| මිහිදු හිමි | - නෑයොත් නො නෑයොත් හැර අනෙකෙකුත් සිටිත් ද ? |
| රජතුමා | - ඇයි ස්වාමීනී මම |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 18 - කයින් පිරිසිදු වෙමු

කුඩා අවධියේ සිටම නීරෝගීව සිටීමට අප හුරුපුරුදු වෙන්න ඕනේ.

**පිරිසුදුව පිළිවෙලට ඉන්න අපි පුරුදු වෙන්න ඕනේ හොඳ පුරුදු**













**පිරිසුදුව පිළිවෙලට සිටීමෙන් අපට ලැබෙන වාසි**

- හිතේ පිරිසිදු කමක් ඇති වීම.
- සිත සතුටු වීම.
- ලෙඩ රෝග අඩු වීම.
- සැමට ප්‍රිය වීම.

**නීරෝගී දිවියක් සඳහාත් , පියකරු පෙනුමක් සඳහාත් කය පිරිසිදුව තබා ගනිමු.**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 19 - ගුරු සිත පිනවා උගනිමු සොඳවා

**ගුරුවරයා විසින් දරුවන්ට**

- මැනවින් හිකමවීම
- මැනවින් ඉගැන්වීම
- සියලු ශිල්ප ඉගැන්වීම
- හිත මිතුරන්ට හඳුන්වා දීම
- රැකවරණය සැපයීම

සිසු දරුවන් විසින් ගුරුවරුන්ට

- දුටුවිට හුනස්නෙන් නැගිටීම
- සියලු ඇප උපස්ථාන කිරීම
- ගුරු උපදෙස් වලට හොඳින් සවන් දීම
- අවශ්‍ය කටයුතු සිදු කර දීම
- හොඳින් ඉගෙනීම

**ඕවාද සිප්ප දානේන**
**සික්ඛාපේති මමං ගරු**
**සගාරවේන චිත්තේන**
**අහං වන්දාමි තං ගරු**

**ඔබා සිප් දීමෙන**
**මා හික්මවන පේමෙන**
**ඇදුරු හද බැතියෙන**
**වදිමි ගරු සිත පෙරටු කරමින**






Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



# 20 - පෝ දා සිල් සමාදන් වෙමු

මාසයක දින 30 න් දින 4 ක් බෞද්ධයන් විසින් ආගමික කටයුතු සඳහා යොදා ගනී.

මෙම දින හතර පෝය නමින් හැඳින්වේ.

- පුර අටවක
- පසළොස්වක
- අව අටවක
- අමාවක

## සිල් රකින්නාගේ සිල් සුවඳ දෙව්ලොව දක්වා පැතිරෙනවා

**සිල් රැකීමෙන් ඇති වාසි**

- අනියත බිය ඉවත් වනවා
- ආත්ම විශ්වාසය වර්ධනය වනවා
- සිත ශක්තිමත් වෙනවා
- පහසුවෙන් සිතේ සමාධිය ඇති වෙනවා
- මිනිසුන්ට දෙවියන්ට ප්‍රිය වෙනවා
- ශරීරය ලෙඩ රෝග වලින් තොර වෙනවා
- කීර්තිය ලැබෙනවා
- මරණින් සුගති භූමියක ඉපදෙනවා

**නිති පන්සිල් රකින**
**පෝය අටසිල් සමාදන් වන**
**බොදු පිළිවෙත් රකින**
**දැහැමි දරුවෝ වෙමුය හැම දින**



(01) පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

(ප්‍රාණීන් නැසීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.)

(02) අදින්නාදාන වේරමණී සික්ඛා පදං සමාදියාමි.

(නොදුන් දෙයක් සොර සිතින් නොගැනීමේ සිල්පදය සමාදන් වෙමි.)

(03) අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛා පදං සමාදියාමි.

(මම උතුම් නොවන හැසිරීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.)

(04) මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි.

(මම බොරු කීමෙන් වැළකීමේ සිල් පදය සමාදන් වෙමි.)

(05) සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

(මම මදයට හා පමාවට හේතුවන මත්වතුර හා මත්ද්‍රව්‍ය භාවිතය වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.

(06) විකාල භෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

(මම නොකල්හි ආහාර ගැනීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.)

(07) නච්ච ගීත වාදිත විසූකදස්සන මාලාගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.)

මම නැටුම් , ගැයුම් , වැයුම් කෝලන් ආදියට සහභාගී වීමෙන් ද මල් , ගඳ විලවුන් ආදිය දැරීමෙන් හා සැරසීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි)

(08) උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛා පදං සමාදියාමි.

(මම උස් අසුන් හා මහ අසුන් වලින් වැළකීමේ සිල් පදය සමාදන් වෙමි.)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 21 - පොදු දේපල රැක ගනිමු

අපට මෙන් ම අනුන්ට ද පරිහරණය කිරීමට තිබෙන දේවල් පොදු දේපළ ලෙස සැලකේ

## පොදු දේපල වල ලක්ෂණ

- අපගේ සුබ සිද්ධිය හා සේවා සැපයීම අරමුණු කරගෙන පවත්වා ගෙන යාම
- ලාභ අපේක්ෂාවෙන් තොරව රජය මගින් සපයා තිබීම
- පොදුවේ සැමට පරිහරණය කළ හැකි වීම

ඔබේ හැකියා හා දක්ෂතා වර්ධනය කර ගැනීමට මේවා පරිහරණය කිරීමට ඔබට අයිතියක් ඇත. එමෙන්ම ඒවා සුරක්ෂිතව පරිහරණය කර අනාගත ඔබේ සහෝදර මිතුරන්ට ද උරුම කර දීම ඔබගේ වගකීමකි.

## පොදු දේපල

- පාසලේ ඇති ගොඩනැගිලි
- පන්සලේ ඇති ගොඩනැගිලි
- දහම් පාසල් පාසලේ ඇති ඩෙස් පුටු
- පුස්තකාල
- රජය මගින් ලබා දෙන පෙළ පොත්

පෙළ පොත්වල සටහන් ලිවීම , කුරුටු ගෑම වරදකි.

දුම්රිය , බස් රථ වල සීට් කවර ඉරීම කුරුටු ගෑම වරදකි.

පාසලේ දහම්පාසලේ ඇති ඩෙස් පුටු බංකු කැඩීම , කුරුටු ගෑම වරදකි.

- බස්රිය
- දුම්රිය
- ක්‍රීඩා පිය
- රෝහල
- පන්සල
- පල්ලිය
- නාන ළිඳ

පොදු දේපල ද අපගේ දේපල වේ

පොදු දේපල අපට නොමිලේ ලැබුණ ද පොදු දේපළ නඩත්තුවට රජය විසින් විශාල මුදලක් වැය කරයි.





Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 22 - බුදු පුද ලද බෝ රද

බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් වැඳුම් පිදුම් කිරීමට සුදුසු ස්ථාන තුනකි. ඒවා ත්‍රිවිධ චෛත්‍යයි.

- ශාරීරික චෛත්‍යය — බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දේහයෙන් ශේෂ වී පවතින සර්වඥ ධාතු නිදන් කොට ඇති කරඬු දාගැබ් ආදිය
- පාරිභෝගික චෛත්‍යය — තථාගතයන් වහන්සේ විසින් පාරිභෝග කරන ලද ජය ශ්‍රී මහා බෝධිය ද පාත්‍ර , චීවර , බඳ පටි , සෙනසුන් ආදිය
- උද්දේසික චෛත්‍යය — ශාරීරික , පාරිභෝගික ධාතු නිදන් නොකොට බුදුරජාණන් වහන්සේ වෙනුවට වැඳුම් පිදුම් කිරීමට ප්‍රතිමා හා ස්තූප



ශ්‍රී මහා බෝධි ශාඛාව **අනුරාධපුර මහමෙව්නා උයනේ** රෝපණය කර ඇත.

ශ්‍රී ලංකාව ශ්‍රී මහා බෝධීන් වහන්සේ එවන ලද්දේ එවකට දඹදිව රාජ්‍ය පාලය කළ **ධර්මාශෝක රජතුමායි**.



ශ්‍රී මහා බෝධී ශාඛාව මෙරටට වැඩම කරවන ලද්දේ **සංඝමිත්තා තෙරණියයි**. ඒ උඳුවප් පෝය දිනකයි.

එදවස ශ්‍රී ලංකාවේ රජ කළේ දෙවනපෑතිස් රජතුමායි.

අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිහිටුවා ඇති බිම් කොටස **උඩමළුව** නම් වේ.



බුදුරජාණන් වහන්සේ බෝධීන් වහන්සේට මුණලා **බෝධිය දෙස ඇසිපිය නොහෙළා** බලා සිට බෝධීන් වහන්සේට ගෞරව කළා.


**ශ්‍රී මහා බෝධියේ ආරක්ෂාව**

- පරිවාර බෝධීන් වහන්සේලා පිහිටුවා තිබේ.
- රන් වැටකින් ද රැකවරණය සැලසේ.
- පාත මළුව වටා ගොඩ නගා ඇති පැරණි ගල් වැට ද ආරක්ෂාව සඳහා තනවන ලද්දකි.

මහ බෝසතාණන් වහන්සේ බුද්ධත්වට පත් වන විට සෙවණ දුන් ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිහිටා තිබෙන්නේ **දඹදිව බුද්ධගයාවේ** ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 23 - පොසොන් උදාවයි - මිහින්තලාවයි





- ලංකාවේ ප්‍රථම මහණ උපසම්පදාව සිදු වීම ද පොසොන් පොහෝ දින සිදු වුණා.
- බුද්ධ චරිතය දෙස බලන කල්හි

බුදුන් වහන්සේ බුදු වී සිව්වන සතියේ රුවන්ගෙයි වැඩ සිටිමින් ධර්මය මෙනෙහි කළා. එහිදී සවණක් ගණ බුදුරැස් මාලාවෝ බුද්ධ ශරීරයෙන් විහිදුනේ පොසොන් පොහොය දිනකයි.

**පොසොන් පොහෝ දින අපි මොනවද කරන්නේ .........**

- ❖ සිල් සමාදන් වෙනවා
- ❖ විහාරස්ථාන කරා ගමන් කරනවා
- ❖ මල් පූජා කරමින් පහන් දල්වමින් තෙරුවන් ගුණ සිහි කරනවා
- ❖ විශේෂ ධර්ම දේශනාවලට සවන් දෙනවා
- ❖ භාවනා කරනවා
- ❖ දන්සැල් සංවිධානය කරනවා
- ❖ පොසොන් කූඩු හදනවා
- ❖ පොසොන් තොරණ බඳිනවා
- ❖ පොසොන් සැරසිලි වලින් නිවස හැඩ කරනවා
- ❖ පොසොන් බැති ගී පවත්වනවා






## පෙරහැර අංග

| | |
|---|---|
| ඔස කරුවන් | නැට්ටුකරුවන් |
| මල් බයිසිකල් | අලි ඇතුන් |
| මල් හා කොඩි ගෙනයන අය | ධාතු කරඬුන් වහන්සේ |
| උඩරට පහතරට බෙරකරුවන් | ගිනි බෝල කරුවන් ආදියයිග |



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 24 - මව් පියන්ට සැලකූ ගිරවා

ගෞතම බුදුරජාණන් වහන්සේ මුල් වරට  බුදු බව පැතුවේ සිය මව නිසාය.

නැගී ගිය නැව විනාශ වූ තැන ලැල්ලක් මත නැගුණු බෝසතාණන් වහන්සේ මව කරපිට තබාගෙන දින හතක් නිරාහාව පිහිනූ බව මාතුපෝෂක ජාතක කතාවේ දැක්වේ. බෝසතාණන්ගේ මව "පුතේ උඹ බුදු වෙයන් "ලෙස පැවසුවා. ඒ බුදු බව පිණිස කළ මුල්ම ප්‍රාර්ථනාව විය.

දරුවන් ජීවිතයට හුරු කරවීමේ මූලික පාඩම උගන්වන්නේ දෙමාපියන්ය.

ඒ නිසා දෙමාපියන් **පුබ්බාචරිය** නමින් හඳුන්වයි. **පූර්වාචාර්ය හෙවත් මුල්ම ගුරුවරු** යන්න එහි අර්ථයයි.

දෙමව්පියන් තුළ **මෙත්තා , මුදිතා , කරුණා හා උපේක්ඛා** යන සිව් බඹ විහරණ ඇති බව **සිඟාලෝවාද සූත්‍රයේ** දැක්වේ.

**දෙමව්පියන්ට සැලකීම බුදුරදුන් පෙන්වා දුන් අයුරු**

- වයස්ගත දෙමව්පියන් පෝෂණය කිරීම
- දෙමව්පියන්ගේ සියළු අවශ්‍යතා කටයුතු ඉටු කර දීම
- කුල පරපුර පවත්වාගෙන යාම
- දායාද රැක ගැනීම
- දෙමාපියන් මිය ගිය පසු පිං අනුමෝදන් කිරීම

**දෙමව්පියන් දරුවන් වෙනුවෙන් ඉටු කළ යුතු දෑ**

- දරුවන් පාපයෙන් වැළැක්වීම
- දරුවන් යහපතෙහි යෙදවීම
- දරුවන්ට ඉගැන්වීම
- සුදුසුම කාලයේ අවාහ විවාහ කර දීම
- තමන් අයත් ධනය සම්පත් නිසි කල පවරා දීම

**දෙමාපියන්ට සැලකීම මංගල කරුණක් අතරින් එකක් වන අතර එය සතර අපායට ගමන් කරන මඟ වළක්වන කරුණක් ලෙස ද බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත.**

**අම්මට තාත්තට සලකන දරුවට**
**කිසි දවසක නෑ වරදින්නේ**
**බුදු දම් සඟ යන තෙරුවන් සරණින්**
**යන යන තැන ඔහු ජය ගන්නේ**





කුඹුරුට එන ගිරව් රංචුව වී ඇට ආහාරයට ගෙන රංචුවේ සිටින ලොකු ගිරවා වී කරල් රැගෙන යනවා ගොවියා දුටුවා. දිනක් ගිරවා අල්වා ගත් ගොවියා "කනාවා මදිවට අරගෙනත් යනවා නේ ද" යැයි ඇසූ විට

"අම්මා තාත්තා වයසයි. ඒ අයටයි රැගෙන යන්නේ" ගිරවා පැවසුවා. මේ ඇසූ ගොවියා ගිරවාගේ දෙමාපිය උපස්ථානය පිළිබඳ පැහැදී කුඹුරෙන් කොටසක්ම ගිරවාට වෙන් කර දුන්නා.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 25 - දහම් කවි

අද අද එයි මරු පින් කර ගන්නේ
කෙලෙස ද හෙට මරු නේති සිතන්නේ
කිකල ද මහසෙන් මරු ඇප වන්නේ
කුමට ද කුසලට කම්මැලි වන්නේ

අප කාටත් කොයි මොහොතේ දී හෝ මරණයට පත් වීමට සිදු වන බැවින් අප හැම දෙනාම ප්‍රමාද නොවී පින්කම් කර ගැනීම අගනේය.

කලකිනි බුදු කෙනෙකුන් උපදින්නේ
දුකකිනි මිනිසත් බව ලැබගන්නේ
මෙදෙකිනි මෙ සසර දුක් දුරලන්නේ
සුදනෙනි කිම වීරිය නොකරන්නේ

බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහල වීම ද මිනිසකු වී උපත ලැබීම ද කලාතුරකින් සිදු වන දේය. එබැවින් සසර දුක් නැති කිරීම පිණිස උත්සාහ කරන්න.

වැනුවානම් බුදු ගුණ වැනුවාමය
තැනුවා නම් තම සිත තැනුවාමය
දෙනුවානම් දන් පින් දෙනුවාමය
දිනුවානම් පරලොව දිනුවාමය

බුදුගුණ වර්ණනා කිරීමත් , තමන්ගේ සිත දියුණු කර ගැනීමත් , දන්දීම ආදී පින්කම් හි යෙදීමත් , පරලොව ජය ගැනීමත් උසස් ක්‍රියාවන්ය.

**ලෝවැඩ සඟරාව - වීදාගම හාමුදරුවන්ගේ**

**බෞද්ධ උපදේශ කාව්‍යයකි.**

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

මා වැනි දියණියක හදා වඩා පෝෂණය කළ ආදරණීය දෙමව්පියන්ටත් මෙය සකස් කිරීමට අවශ්‍ය කාලය ලබා ගැනීමේ දී සහය වූ මා ආරණීය සැමියාටත් , පොත පත සපයා දෙමින් උපකාර කළ ලුණුගම සිරිපැරකුම්බා දහම්පාසලේ වර්තමාන ප්‍රධානාචාර්ය දිනේෂ් උදයංග විමලධර්ම මහතාටත් , ශක්තියක් වෙමින් මා අසලින් රැඳී සිටින මා ආදරණීය කලයාණ මිතුර මිතුරියන්ටත් සෙනෙහසින් මා හද පිරි කෘතගුණය මෙලෙස පුද කරමි.

**ස්තූතියි ...........**